www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදියෝ සිය සගයකු පැහැර ගෙන ගොස් වධ බන්ධනයට ලක් කිරීමට විරෝධය දක්වති

## Sri Lankan journalists protest against abduction and torture of colleague

අපගේ වාර්තාකරුවන් විසිනි
2008 මැයි 28

සතිපතා ඉංග්‍රීසි පුවත්පතක් වන නේෂන් පත්‍රයේ සම කර්තෘ කීත් නොයාර් පැහැර ගෙන ගොස් ඔහුට පහර දීමට විරෝධය දක්වමින් මැයි 23 දා දිවා කෑම පැයේ දී මාධ්‍යවේදීන් 200ක් පමන කොලඹ ජනාකීර්න සන්ධියක දී පිකට් උද්ඝෝෂනයක් පැවැත්වූහ. ජනාධිපතිගේ නිල නිවාසය වන අරලිය ගහ මන්දිරය දෙසට විරෝධතාකරුවන් පා ගමනින් යාම වලකනු වස් ඉහල පොලිස් නිලධාරින් ගනනාවක් ද ඇතුලු 100කට අධික පොලිස් භටයන්ගෙන් සමන්විත ආරක්ෂක බල ඇනියක් බලමුලු ගන්වා තිබුනි.

ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය හා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඇතුලු මාධ්‍ය සංවිධාන පහක් විසින් විරෝධතාව සංවිධානය කරන ලදි. නොයාර් පැහැර ගෙන ගොස් ඔහුට පහර දුන්නේ කවුද යන වග සොයා ගනු වස් පූර්න පරීක්ෂනයක් ඉල්ලා සිටි විරෝධතාකරුවෝ නොයාර් පැහැර ගෙන යාම ඇතුලු මාධ්‍යවලට හා මාධ්‍යවේදීන්ට යලි යලිත් එල්ල වූ ප්‍රහාරවලට සම්බන්ධ බවට ආන්ඩුවට චෝදනා කලහ.

නොයාර් වධ බන්ධනයට ලක් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු අයගේ අනන්‍යතාව තව මත් තහවුරු කර ගත යුතුව ඇතත් ශ්‍රී ලංකා මිලිටරියේ හෝ ඒ හා සම්බන්ධිත පැරා-මිලිටරි කන්ඩායම්වල සාමාජිකයන් හෝ මැරයන් එම සිද්ධියට සම්බන්ධ වූ බවට ඉඩ ඇත. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ජනාධිපති මහින්ද රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධයෙන් අනතුරුව මාධ්‍ය හා මාධ්‍යවේදීන් මර්දනය කරනු පිනිස ආන්ඩුවේ ද නිහඬ සහයෝගය සහිතව එල්ල කෙරෙන දීර්ඝ ප්‍රහාර මාලාවක මෑතම සිද්ධිය නොයාර් පැහැර ගෙන යාමයි.

නේෂන් පුවත්පතේ ආරක්ෂක ලියුම්කරු වන නොයාර් කොලඹ ජාතික රෝහලේ සිය ලෙඩ ඇඳේ සිට ලෝක සමාජවාදී වෙබ් අඩවියට කෙටියෙන් කතා කලේ ය. කොලඹ නගරයට යාබද දෙහිවල පිහිටි ඔහුගේ නිවස අසල දී මැයි 22 දා රාත්‍රී 10.30ට පමන ඔහු පැහැර ගෙන යන ලදි. නිවස බලා ගිය ඔහු පිටුපස වෑන් රියක් ලුහුබැඳ තිබුනි. මිනිසුන් තිදෙනෙක් ඔහුගේ දෑත් හා දෙඇස් බැඳ ඔහුව වෑන් රියට ඇද දමා පැයක පමන කාලයක් වෑන් රිය පදවා ගෙන ගොස් තිබුනි.

නොයාර්ට ලී පොලුවලින් දරුනු ලෙස පහර දෙන ලදි. පසු දින උදෑසන 4ට පමන ඔහුව සිය නිවස අසල දමා ගොස් තිබුනි. සිය හිස පිටුපසට හා කනට සිදු වූ තුවාලවලින් ද ඔහුගේ දකුනු ඇස අසල හා හක්ක දෙපස ඇති තැලුම්වලින් ද ඔහු තවමත් වේදනා විඳියි. ඔහුගේ පිටට හා කකුල්වලට දරුනු ලෙස පහර දෙන ලදි. දෑත් බැඳ දමා තිබීමෙන් ඔහුගේ මැනික් කටු අසල තුවාල වී තිබුනි.

ඔහු සිය නිවස අසල දමා ගොස් තිබීමේ කාරනාව ආරක්ෂක හමුදාවල සම්බන්ධය පිලිබඳ සැකය මතු කරයි. පොලීසිය හා මිලිටරිය කොලඹ පුරා හා ඒ වටා පිහිටි උප-නගරවල සෑම ප්‍රධාන සන්ධියක ම පාහේ සෝදිසි කපොලු පිහිටුවා තිබේ. වතාවතක් හැටියට වාහන නවතා පරීක්ෂාව ලක් කෙරෙයි -- විශේෂයෙන් ම අලුයම් කාලයේ දී එලෙස වාහන පරීක්ෂා කෙරෙයි. නොයාර් පැහැර ගත්තවුන් ඒ ගැන කිසිදු තැකීමක් කලේ නැත යන්න බලගතු ලෙස මතු කරන්නේ මිලිටරියේ හෝ පොලීසියේ ඉහල මටටම්වලින් ඇති සම්බන්ධයක් ය.

නොයාර්ට අනුව, මිලිටරි කටයුතු පිලිබඳ ලිපි සම්බන්ධයෙන් ඔහුගේ මූලාශ්‍ර හෙලිදරව් කර ගැනීමට ඔහුව පැහැර ගෙන ගිය අයට අවශ්‍ය විය. ඔහු යුද්ධයේ ආධාරකරුවකු වුව ද, ඉහල මිලිටරි නිලධාරින් ද ආන්ඩුව යුද්ධය ගෙන ගොස් ඇති ආකාරය ද ගැන නොයාර් විවේචනශීලී වී ඇත. ඔහුව පැහැර ගෙන ගිය අයට දැන ගැනීමට අවශ්‍යව තිබුනේ කුමක් ද යන වග ඔහු ප්‍රසිද්ධ කල හොත් ඔහුට දරුනු ප්‍රතිවිපාකවලට මුහුන දීමට සිදු වනු ඇතැයි තර්ජනය කරන ලදි.

මැයි 11 දා නේෂන් පත්‍රයේ පල වූ නොයාර්ගේ ලිපිය ඔහුව පැහැර ගෙන යාමට තුඩු දෙන්ට ඇතැයි පසුගිය සිකුරාදා විරෝධතාවට එක් වූ මාධ්‍යවේදියෝ සිතති. "හමුදාවක් යනු එහි ප්‍රධානියාගේ පුද්ගලික නින්දගමක් නොවේ" යන ශීර්ෂ පාඨය සහිත එම ලිපිය, යුද හමුදාපති මේජර් ජෙනරාල් සරත් ෆොන්සේකාගේ ක්‍රියාකලාපය විවේචනය කලේ ය. එය පල වීමෙන් පසුව ඔහු කිහිප වතාවක් ම තර්ජනයන්ට ලක් වූ බවත් ඒ සම්බන්ධයෙන් ඔහු පූර්ව ආරක්ෂක පියවර ගෙන තිබූ බවත් නොයාර්ගේ පවුලේ සාමාජිකයෝ මාධ්‍යවලට පැවසූහ.

මොන තරම් සීමිත වුවත්, ආරක්ෂක හමුදා සම්බන්ධ මොන යම් හෝ විවේචනයක් ඉවසීමට රාජපක්ෂ ආන්ඩුව හා මිලිටරිය සූදානම් නැත. ජනාධිපතිගේ සොහොයුරා ද වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, මේ මස මුල දී රාජ්‍ය රූපවාහිනියට කල කරනු දැක්වීමක දී, "ආරක්ෂක හමුදාවන්ට හා මිලිටරි මෙහෙයුම්වලට හානිකර" වාර්තා පල කරන මාධ්‍යවේදීන් "මාධ්‍ය ද්‍රෝහීන්" ලෙස හංවඩු ගසමින් ඔවුන්ට පහර ගැසී ය. එවන් මාධ්‍ය තහනම් කල යුතු යැයි ඔහු ඉල්ලා සිටියේ ය.

ජනවාරියේ දී *ඉරිදා ලංකාදීප* පත්‍රය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී, මිලිටරි කටයුතු පිලිබඳ වාර්තා මුලුමනින් ම වාරනය කල යුතු යැයි ආරක්ෂක ලේකම්වරයා ඉල්ලා සිටියේ, "හමුදාව ගැන කිසිම දෙයක් වාර්තා කිරීම අවශ්‍ය නැහැ" යැයි තර්ක කරමිනි. ආන්ඩුවේ පිලිවෙතට අනුකූලව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන මාධ්‍ය "දේශද්‍රෝහීන්" බවත් මිලිටරියේ යුද ප්‍රයත්නයන්ට පවත්නා "ලොකුම බාධාව" එවන් මාධ්‍ය බවත් ෆොන්සේකා ජනවාරි 2 දා *දිනමිණ* පත්‍රයට පැවසී ය.

2006 ජුලි මස දී එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගැනීමේ ආක්‍රමන මෙහෙයුම් සඳහා ජනාධිපති රාජපක්ෂ අන දීමෙන් පසුව මිලිටරිය නැගෙනහිර පලාතේ දී ඉක්මන් ජයග්‍රහන ගනනාවක් ම ලබා ගත්තේ ය. කෙසේ වෙතත්, පසුගිය වසරක කාලය මුලුල්ලේ, උතුරේ ඉතිරිව පවත්නා එල්ටීටීඊ බල කඳවුරු අත්පත් කර ගැනීමේ සිය ප්‍රයත්නවල දී හමුදාව එරී තිබේ. පසුගිය මාසයේ දී මුහමලෙයි අසල අසාර්ථක ආක්‍රමනික මෙහෙයුමකින් මිලිටරියට දැවැන්ත ජීවිත හානි සිදු විය. යුද්ධයේ වියදම ජීවන මට්ටම් මත බලපාන්නේ වැඩෙන මහජන අසන්තෘප්තියක් නිර්මානය කරමිනි.

ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට උසස්වීම් හා පදක්කම් ලබා දීමේ දී හිතවත් අයට ප්‍රමුඛත්වය ලබා දෙන්නේ යැයි නොයාර්ගේ මැයි 11 දා ලිපිය ජෙනරාල් ෆොන්සේකාට චෝදනා කලේ ය. එක් නිදසුනක් වූයේ "අවශ්‍ය අත්දැකීම්වලින්" තොරව යාපනයේ 53 වන ප්‍රහාරක ඒකකයේ ප්‍රධානියා බවට පත් කරන ලදුව මුහමලෙයි ව්‍යසනයට සහභාගි වූ හමුදා භටයන් මෙහෙය වූ බ්‍රිගේඩියර් සමන්ත සූරියබන්ඩාර ය.

පුද්ගලික කෝන්තර හා එදිරිවාදුකම් නිසැකව ම පවතින අතර, යුද්ධය දිගට ඇදෙන තතු තුල මිලිටරියේ ඉහල තට්ටු අතර පැහැදිලිව ම තියුනු ආතතීන් මතු වෙමින් ඇත. එල්ටීටීඊයට එරෙහි ඉක්මන් ජයග්‍රහනයක් මත බොහෝ සෙයින් රදා පවත්නා රාජපක්ෂ ආන්ඩුව, යුද්ධයට සහයෝගය දෙන අය වෙතින් පවා එල්ල විය හැකි, මිලිටරිය පිලිබඳ මොන යම් හෝ ප්‍රසිද්ධ විවේචනයක් සම්බන්ධයෙන් අතිශයින් නොසන්සුන් බවට පත් වේ.

මාධ්‍යවේදීන් පැහැර ගෙන යාම හා ඝාතනය කිරීම ද මුද්‍රනාලවලට ප්‍රහාර එල්ල කිරීම ද ඇතුලු මාධ්‍යවලට එරෙහි රාජ්‍ය මර්දනය, 2005 නොවැම්බරයේ දී රාජපක්ෂ ජනාධිපතිවරනය යන්තමින් ජයගත් අවස්ථාවේ පටන් වර්ධනය වී තිබේ. වාරනය නිල වසයෙන් ක්‍රියාත්මක කර නැති නමුදු, මිලිටරිය විසින් නිකුත් කරනු ලබන ප්‍රචාරක වාර්තාවන්ට වෙනස්ව නොයන ලෙසට ආන්ඩුව මාධ්‍යවලට නැවත නැවතත් අනතුරු අඟවා තිබේ.

2007 මැයි සිට 2008 මැයි දක්වා කාල පරිච්ඡේදය තුල දී, මාධ්‍ය සේවකයන් හෝ මාධ්‍යවේදීන් ගොදුරු කෙරුනු ඝාතන දෙකක්, පැහැර ගෙන යාම් දෙකක් (නොයාර්ට අමතරව) හා අත් අඩංගුවට ගැනීම් 15ක් සිදුව ඇති බවට නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වාර්තා කර තිබේ. එම කාල පරිච්ඡේදය තුල දී ම, ගුවන් විදුලි නාලිකා පහක බලපත්‍ර අත්හිටුවන ලදි. ජාත්‍යන්තර මාධ්‍යවේදී සම්මේලයට අනුව, 2007 වසර තුල දී ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් හය දෙනෙක් ඝාතනය කෙරී ඇත.

වඩාත්ම කුප්‍රකට සිද්ධීන්වලට මේවා ඇතුලත් ය:

- මේ වසරේ මැයි 19 දා වෙසක් පොහෝ දින උත්සව වාර්තා කරමින් සිටි සිරස ටීවී ආයතනයේ සේවකයන් පිරිසකට කිරිබත්ගොඩ දී මැර කන්ඩායමක් පහර දෙන ලදි. කම්කරු ඇමති මර්වින් සිල්වා කිරිබත්ගොඩ ප්‍රදේශයේ පාලක ශ්‍රී

ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) සංවිධායක වන අතර ඔහුගේ මැර ක්‍රියා පිලිබඳ වාර්තා කිරීම ගැන ඔහු *සිරස ටීවී* ආයතනය සම්බන්ධයෙන් විශේෂ වෛරයකින් පසු වේ.

- මාර්තු 17 දා, ජනාධිපති රාජපක්ෂ, රජය සතු ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (ශ්‍රීලරූස) සේවකයන්ගේ වර්ජනයක් මඩිනු ලෙස මිලිටරියට අන කලේ ය. එම වර්ජනයට හේතු වූයේ, සිය කතාවක් විකාශනය නොකිරීමට හේතු විමසමින් පසුගිය දෙසැම්බරයේ දී එම රූපවාහිනී මධ්‍යස්ථානයට කඩා වැදුනු කම්කරු ඇමති සිල්වාට විරුද්ධව පියවර ගැනීමට ආන්ඩුව අසමත් වීම යි. ඔහුගේ මැරයෝ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයකුට පහර දුන්හ. වර්ජනය මැඩීමෙන් දින දෙකකට පසුව, රාජපක්ෂ රූපවාහිනී සංස්ථාව අධීක්ෂනය කරනු පිනිස විශ්‍රාමලත් හමුදා ජෙනරාල්වරයකු පත් කලේ ය.

- මාර්තු 7 දා, *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ ලියුම්කරුවකු හා *අවුට්රීච්* වෙබ් අඩවියේ සංස්කාරක වන ජේ.එස්. තිස්සනායගම් පොලීසියේ කුප්‍රකට ත්‍රස්ත විමර්ශන ඒකකය මගින් අත් අඩංගුවට ගන්නා ලදි. අත් අඩංගුවෙන් මාස දෙකකට වැඩි කලක් ගෙවී ඇතත්, ඔහු තවමත් රැඳවුම් භාරයේ සිටින අතර ඔහුට කිසිදු චෝදනාවක් එල්ල කෙරී නැත.

- නොවැම්බර් 21 දා, සන්නද්ධ කල්ලියක් කොලඹට දකුනින් පිහිටි ලීඩර් ප්‍රකාශන ආයතනයේ මුද්‍රනාලය තුලට කඩා වැදී එය ගිනිබත් කලේ ය. දූෂනය, ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය හා ආන්ඩුවට හිතවත් පැරා-මිලිටරි කන්ඩායම්වල ක්‍රියාකාරකම් පිලිබඳ කාරනා සම්බන්ධයෙන් රාජපක්ෂ ආන්ඩුව විවේචනයට ලක් කරන පුවත්පත් ගනනාවක් ම මෙම ප්‍රකාශන ආයතනය විසින් පල කරනු ලැබේ.

- පසුගිය වසරේ දී, මිලිටරිය හිතාමතා ම ඔහුගේ ආරක්ෂක භටයන් ඉවත් කර ගැනීමෙන් පසුව, සැඟව සිටීමට *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ ආරක්ෂක ලියුම්කරු ඉක්බාල් අතාස්ට බල කෙරුනි. ගුවන් හමුදාව සඳහා මිග් ප්‍රහාරක යානා මිලදී ගැනීමේ දී සිදු වූ, රාජපක්ෂ පවුලේ සාමාජිකයකු ද සම්බන්ධ, ඉහල ම පෙලේ දූෂනයකට අවධානය යොමු කරමින් ලියන ලද ලිපියක් පල කිරීමෙන් පසුව ඔහුට තර්ජන එල්ල වුනි. නොයාර් මෙන් ම අතාස් ද යුද්ධයේ ආධාරකරුවකු වන අතර, ඔහුගේ විවේචන පිලිබිඹු කරන්නේ ආරක්ෂක සංස්ථාපිතය තුල ම පවත්නා අසන්තෘප්තිය යි.

නොයාර් පැහැර ගෙන යාම සම්බන්ධයෙන් එල්ල වන විවේචනවල සැර බාල කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, ජනාධිපති රාජපක්ෂ ඒ පිලිබඳ පරීක්ෂනයක් පවත්වන ලෙස පොලිස්පතිට අන කර තිබේ. එහෙත් ආන්ඩුවේ අතීත වාර්තාව යම් මග පෙන්වීමක් ලෙස ගත හොත්, එම පරීක්ෂනය සුදුහුනු ගෑමක් වනු ඇත. මාධ්‍යවේදීන් හා මාධ්‍ය සේවකයන් ඝාතනය, පැහැර ගෙන යාම හා ඔවුන්ට පහර දීම සම්බන්ධයෙන් කෙරුනු එවන් "පරීක්ෂන" වල ප්‍රතිඵලයක් ලෙස කිසිදු අත් අඩංගුවට ගැනීමක් හෝ කිසිවකු වරදකරුවකු කිරීමක් සිදු වී නැත.

© www.wsws.org